**පානදුර නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 13 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පානදුර නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර තිබූ ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු රු.9,343,929 ක් වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන සළසා තිබුණේ රු.91,471 ක් සඳහා පමණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ කර්මාන්ත සඳහා ලැබිය යුතු මූලධන ආධාර රු.8,285,007 ක් වුවද රු.2,500,896 ක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 21,040,432 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,817,618 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,646,806 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| (i.) වරිපනම් හා බදු | 45,113 | 27,330 | 24,861 |
| (ii.) බදු කුලී | 2,580 | 2,166 | 4,806 |
| (iii.) බලපත්‍ර ගාස්තු | 266 | 266 | 222 |

### 2:2:2 වරිපනම් බදු

(අ) 2012 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ වරිපනම් බදු ශේෂය තුල රු.50,000 ට වැඩි අවු. 0-1 ත් අතර රු.2,196,537 ක්ද, අවු. 2 ත් 5 ත් අතර රු.1,738,467 ක්ද , අවු. 5 ට වැඩි රු.449,313 ක්ද 2013 නොවැම්බර් 25 දින වන විටත් හිඟව පැවතුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට කොට්ඨාශ අංක 02 හි පමණක් පැවති හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු.10,000 ට වැඩි හිඟ ශේෂයන් 13 කින් රු.384,193 ක් හිඟව පැවතුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ වරිපනම් බදු ශේෂයෙන් 2013 සැප්තැම්බර් 30 වන විට රු.11,561,151 ක් පමණක් අයවී තිබීමෙන් තවදුරටත් රු.12,828,166 ක හිඟ ශේෂයක් විය.

### 2.2.3 වෙනත් ආදායම්

(අ) සභා බල ප්‍රදේශයේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී තිබූ එක් ආයතනයක් වෙතින් නගර සභා ආඥා පනතේ 164(2) වගන්තිය අනුව ගාස්තු අය කර නොතිබුණි.

(ආ) සංචාරක හෝටල්වලින් අයකර තිබූ ආදායම් එම ආයතනවලින් ලබා දී තිබූ විස්තර මත පමණක් පදනම්ව ආදායම ගණනය කර අයකර තිබූ අතර සත්‍ය වශයෙන් බලපත්‍ර ගාස්තු අයකර ගත යුතු ආදායම් කොපමණද යන්න තහවුරු කර ගෙන නොතිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියෙන් ලබා ගත් තොරතුරු අනුව සභා බල ප්‍රදේශයේ පැවති ආපනශාලා දෙකකින් 2012 වර්ෂයේ, ඒවායේ ලැබීම් මත අධිකාරිය අයකර තිබූ සියයට 1 ආදායම රු.31,109 ක් වුවද, සභාවට ගෙවා තිබූ සියයට 1 ආදායම රු.6,966 ක් විය.

2.2.4 උසාවි දඩ

(අ) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු තම කලාපයෙන් මසකට අවම වශයෙන් ආහාර සාම්පල් 2 ක් වත් පරීක්ෂා කළ යුතු වුවත්, 2012 මැයි 07 දින එක් වෙළඳසැලකින් පමණක් ආහාර සාම්පල් ලබා ගෙන පරීක්ෂාවට යවා තිබූ නමුත් විගණිත දිනය වූ 2013 ජනවාරි 21 දින වන විටත් වාර්තාව ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආහාර සාම්පල් සම්බන්ධයෙන් පවරා තිබූ නඩු සඳහා දඩ ලෙස 2008 වර්ෂයේ සිට 2012 දක්වා රු.68,000 ක මුදලක් උසාවිය අය කර තිබූ නමුත් ඉන් සභාවට ලැබිය යුතු සියයට 75 ක ප්‍රමාණය වූ රු.51,000 ක මුදල ලබා ගෙන නොතිබුණි.

2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1998 ඔක්තෝබර් 12 දිනැති අංක 3/2/3/4/2 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව වාහන මිලදී ගැනීමට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු නමුත් 2012 වර්ෂයේ මිලදී ගෙන තිබූ වාහන 3 ක් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතබුණි.

2.4.1 සේවක ණය

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන සේවය හැර ගිය, විශ්‍රාම ගිය, මිය ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,453,345 ක ණය ශේෂයක් 2012 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.534,074 ක හඳුනා නොගත් සේවක ණය ශේෂයක් විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1990 වර්ෂයේ සිට ලබා දී තිබූ එකතුව රු.1,112,885 ක් වූ අත්තිකාරම් 2012 දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි.

(ආ) 2006 සිට 2010 දක්වා කාලයට අදාල එකතුව රු.7,135,885 ක් කල් ඉකුත් වූ තැන්පතු ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව විගණිත දිනය වූ 2013 ජුනි 10 වන විටත් පියවර ගෙන නොතිබුණි.

---

(ඈ) ආදායම් විෂයයන් 6 ක සියයට 21 සිට සියයට 339 දක්වා පරාසයක් තුළ විචලනයක් අනාවරණය වීමෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

2.6 අභ්‍යන්තර විගණනය

---

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128, 132, 134 සහ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක WP/LGD/10/2008 සහ 2008 අගෝස්තු 19 දිනැති චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) අයවැයකරණය